හිමිකම් රක්ෂණ අරමුදල

உரிமைகள் காப்புறுதி நிதியம்

Title Insurance Fund



රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாய்கம் திணைக்களம்

Registrar General's Department

කාර්ය සාධන වාර්තාව හා ගිණුම් - 2024

செயலாக்க அறிக்கை மற்றும் கணக்குகள் - 2024

Performance Report & Accounts - 2024

හිමිකම් රක්ෂණ අරමුදල

කාර්ය සාධන වාර්තාව හා ගිණුම් - 2024



රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පටුන

පරිච්ඡේදය 01- අරමුදලේ පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 අරමුදල පිහිටුවා ඇති නෛතික රාමුව(පනත,භාර ඔප්පුව,වෙනත්)

1.3 අරමුදලේ පරමාර්ථ

1.4 අරමුදලේ දැක්ම, මෙහෙවර,අරමුණු

1.5 ප්‍රධාන කාර්යයන්

1.6 සංවිධාන සටහන

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු(තිබේ නම්)

අ) ව්‍යාපෘතියේ නම

ආ) දායක නියෝජිතායතන

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේනුතගත වියදම-රු.මි

ඈ) ව්‍යාපෘති කාල සීමාව

පරිච්ඡේදය 02- ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

විශේෂ, ජයග්‍රහණ , අභියෝග හා ඉදිරි ඉලක්ක කෙටියෙන් පැහැදිලි කරන්න.

පරිච්ඡේදය 03- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය ප්‍රකාශන

3.1.1මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

3.1.2මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

3.1.3මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

3.1.4 ලැබීම් හා ගෙවීම් ගිණුම

3.1.5ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

3.1.6ශේෂ පිරික්සුම

3.1.7මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්

3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන(පවතීනම්) උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තාව

3.5 විගණකාධිපතිගේ වාර්තාව

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 අරමුදලේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු

5.1 හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

6.2 අරමුදලේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙයටියෙන් සඳහන් කරන්න.

6.3 මානව සම්පත් සංවර්ධනය

පරිච්ඡේදය 07 -අනුකූලතා වාර්තාව

හිමිකම් රක්ෂණ අරමුදලේ සභාපතිතුමාගේ පණිවිඩය

ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ස්ථාපිත කොට ඇත්තේ වර්ෂ 1864 ජනවාරි මස දීය. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවෙන් සලසනු ලබන සේවාවන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය මංපෙත් එළිපෙහෙළි කරමින් ඉදිරියට ගමන් කරමින් සිටී. මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කළ මුල් අවධියේ ප්‍රමුඛතම කර්තව්‍ය වූයේ ලේඛන ලියාපදිංචි කිරීම වුව ද පසුකාලීනව එනම් වර්ෂ 1867 දී පටන් ශ්‍රී ලාංකීය මහජනතාවගේ සිවිල් අයිතීන් වන විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කටයුතු ද සිදු කර ඇත.

ඒ අතරින් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත, ඉඩම් කොටසක් පිළිබඳ හිමිකම් විමර්ෂණය කිරීම සහ ලියාපදිංචි කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කාරණා සඳහා ද විධි විධාන සැලැස්ම පිණිස ස්ථාපිත කර ඇත.මෙමගින් ශ්‍රී ලංකාවේ සෑම බිම් ඒකකයක් සඳහාම අනන්‍ය වූ අංකයක් සහිත රජය විසින් හිමිකම තහවුරු කරන ලද අවසානාත්මක ඉඩම් හිමිකමක් ලැබේ. මෙහිදී ඉඩමේ අයිතිය තුළින් ජනතාව ආර්ථික හා මානසික වශයෙන් සවිබල ගැන්වීමක්, ඉඩම් සංවර්ධනය සඳහා වැඩි අවස්ථාවක් ලබා දීමත්, විද්‍යාත්මක ඉඩම් කළමනාකරණයක් සිදු වේ. මෙම වැඩසටහන මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වෙමින් ක්‍රියාත්මක වේ. මේ වන විට දිවයින පුරා ඉඩම් කාර්යාල 31ක ස්ථාපිත කර ඇති හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ඉමහත් සේවයක් සපයමින් සාර්ථකව ක්‍රියාත්මක වන අතර මෙය තවදුරටත් ව්‍යාප්ත වීමත් සමඟ මුළු ලංකාවම ආවරණය වන පරිදි ඉඩම් තොරතුරු පද්ධතියක් නිර්මාණය වේ.

මෙහිදී හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධි විධාන අනුව යමින්, ඉඩම් හිමිකරුගේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් පාර්ශවකරුවන්ට වන හානිය වැළැක්වීම සඳහා හෝ කිසියම් වෙනත් හේතුවක් මත ඉඩම් අයිතිකරුවන්ට අධිකරණ නියෝග මත වන්දි ගෙවීම සඳහා මෙවැනි හිමිකම් රක්ෂණ අරමුදලක් පිහිටුවා තිබීම ප්‍රශංසනීයයි. අරමුදලේ ප්‍රථම කළමනාකරණ මණ්ඩල රැස්වීම 2010 වර්ෂයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදී පැවැත්වීමට යෙදුණි. නීති රෙගුලාසි අනුව ක්‍රියාත්මක වෙමින්, හිමිකම් රක්ෂණ අරමුදලේ මුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. 2024 වර්ෂය අවසාන වන විට සමුච්චිත අරමුදල රුපියල් මිලියන 261 ඉක්මවා ඇත.

කුමන තත්ත්වයක් මතදී වුවද රක්ෂණ මණ්ඩලයේ කටයුතු 2024 වසර තුලදී ද අඛණ්ඩව නිසි පරිදි ඉටු කිරීමට හැකි වීම පිළිබඳ කළමනාකරණ මණ්ඩලයට මෙන්ම කාර්ය මණ්ඩලයට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමි. මෙම කාර්යභාර්ය නිසි පරිදි ඉටු කිරීමට විෂයභාර අමාත්‍යාංශයෙන් ලැබුණු මහපෙන්වීම හා උපදේශකත්වය බෙහෙවින් අගය කරමි. අවසාන වශයෙන් වඩාත් විශ්වාසදායී සුරක්ෂිත හිමිකමක් පුරවැසියන් වෙත ලබාදෙනු වස් මෙහි කටයුතු සඳහා ඉදිරියටත් සක්‍රීය දායකත්වය ලබාදීමට අපේක්ෂා කරමි.

එසේම, 2025 වසර තුල සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වල හිමිකම් ලියාපදිංචි කිරීම් කටයුතු ආරම්භ කිරීමට අදහස් කර ඇති බැවින්, ඒ අනුව රක්ෂණ අරමුදල වඩාත් පුළුල් වන අතර දිවයිනේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන අයුරින් එහි ප්‍රතිලාභ ලබාගැනීමට හැකියාව ලැබේ.

ඩබ්.ආර්.ඒ.එන්.එස්.විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල් / හිමිකම් රක්ෂණ අරමුදලේ සභාපති

හිමිකම් රක්ෂණ අරමුදලේ ලේකම්තුමියගේ පණිවිඩය

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධික්ෂණය යටතේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කළමනාකරණය කරන හිමිකම් රක්ෂණ අරමුදල මඟින් යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවයක් පිළිබඳ වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචියකදි අගතියට පත් වූ තැනාත්තාව අධිකරණ නියෝගයක් මත හානි පූර්ණය කිරිම කරනු ලබයි.

හිමිකම් සහතිකයක් නිකුත් කිරීමෙන් පසුව සිදුවන ගණුදෙනු ලියාපදිංචි කිරීම තුලින් ලැබෙන ආදායමෙන් 40% ක මුදලක් හිමිකම් රක්ෂණ අරමුදල සඳහා බැරවන අතර එයින් පරිපාලන වියදම් හැර ඉතිරිය අංක 1616/23 හා 2009.08.24 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ රෙගුලාසි අනුව රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලබයි. මෙමගින් රක්ෂණ අරමුදල තව දුරටත් වර්ධනය වන අතර 2024 වර්ෂය ආරම්භයේදී රුපියල් මිලියන 193ක් පැවති එය 2024 අවසන් වන විට රුපියල් මිලියන 261 දක්වා වර්ධනය වී ඇත.

අරමුදල ආරම්භයේ සිට මේ දක්වා හානිපූර්ණය සඳහා කිසිදු අධිකරණ නියෝගයක් ඉදිරිපත්ව නැති අතර මෙමගින් හිමිකම් ලියාපදිංචියේදි වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචි කිරීම් අවම බව විදහා දැක්වෙන බව අදහස් කරමි. මේ වන විට රක්ෂණ අරමුදලේ ප්‍රතිලාභ ලබාගැනීම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කර ඇති අතර, ඉදිරියේදී තව දුරටත් එම දැනුවත් කිරීම් සිදු කිරීමට පියවර ගෙන ඇත.

හිමිකම් රක්ෂණ අරමුදල සම්බන්ධව හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව හා සම්බන්ධව පවත්වනු ලබන දැනුවත් කිරීම් වැඩසටහන් වලදි දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන අතර, අප දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා පලාත් කාර්යාල හරහාද සිදුවන මහජන හමුවීම් වලදි ද දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

කළමනාකරණ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කරමින් රක්ෂණ අරමුදලේ කටයුතු සාර්ථකව ඉටු කර ගැනීමට මේ වන විට කටයුතු කරගෙන යන අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට ද මග පෙන්වීම හා උපදේශකත්වය ලබාදීම වෙනුවෙන් රක්ෂණ අරමුදලේ සභාපති, රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙමි. ඒ අනුව හිමිකම් රක්ෂණ අරමුදලේ කළමනාකරණ මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සමඟ හිමිකමේ අයිතිය ලියාපදිංචිය තුලින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජනතාවට සහාය වීම සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දීමට ඉදිරියටත් අපේක්ෂා කරමි.

ජේ.ඒ.එස්.කේ.කරුණාරත්න
සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් / හිමිකම් රක්ෂණ අරමුදලේ ලේකම්

පරිච්ඡේදය 01- අරමුදලේ පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව ඉඩම් මැන නිරවුල් කර, හිමිකම ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කර අදාල පාර්ශවකරුවන් වෙත හිමිකම් සහතික ලබාදීම සිදුකරගෙන යනු ලැබේ. මේ සඳහා මෙම දෙපාර්තමේන්තුව යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 31ක හිමිකම් ලියාපදිංචි කිරීමේ කටයුතු දැනටමත් සිදු කරගෙන යනු ලබයි. පෙර සඳහන් පනතේ විධිවිධාන අනුව ඉඩම් අයිතිකරුගේ ඉඩම්වල අයිතිය සුරක්ෂිත කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් පාර්ශවකරුවන්ට වන හානිය වැළැක්වීම සඳහා හෝ කිසියම් වෙනත් හේතුවක් මත ඉඩම් අයිතිකරුවන්ට වන හානියට වන්දියක් ලෙස කිසියම් මුදලක් අධිකරණ නියෝගයක් මත ප්‍රතිපූර්ණය කිරීමට පනතේ ඉඩකඩ සලසා ඇත.

ඒ අනුව 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62(1) වගන්තිය පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කළමනාකරණය කළයුතු හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවීම සඳහා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා සහ ඉඩම් අමාත්‍යවරයා විසින් 2003 ජුනි මස ඉදිරිපත් කරන ලද පොදු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2003.10.08 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර රක්ෂණ අරමුදලට අදාල නියෝග අංක 1616/23 හා 2009 .08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇත. එකී රෙගුලාසිවලට අනුව හිමිකම් රක්ෂණ අරමුදල සඳහා 2009 වර්ෂයේදී කළමනාකරණ මණ්ඩලයක් පත්කර ඇති අතර 2010.02.23 වන දින ප්‍රථම කළමනාකරණ මණ්ඩල රැස්වීම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදී පවත්වා ඇත.

හිමිකම් රක්ෂණ අරමුදලේ බැංකු ගිණුම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරන ලද බැංකුවක ආරම්භ කිරීමට තීරණය කර ඇති අතර ඒ අනුව ලංකා බැංකුව බත්තරමුල්ල ශාඛාවේ අදාල ගිණුම ආරම්භ කර ඇත. මෙම අරමුදලට මුදල් එකතු වන්නේ හිමිකම් ලියාපදිංචි කිරීමට අදාල පසු ගණුදෙනු ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු වලිනි. රක්ෂණ අරමුදල සම්බන්ධයෙන් වූ නියෝග ඇතුලත් අංක 1616/23 හා 2009.08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය පරිදි මාසය තුල හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබුණු ආදායමින් 40% ක් රක්ෂණ අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර එම මුදලින් 25%ක් අරමුදලේ පරිපාලන වියදම් දැරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට ගෙවනු ලැබිය යුතුය.

එකී ගැසට් පත්‍රයේ සඳහන් පරිදි රක්ෂණ අරමුදලේ මුදල්වලින් හැකි උපරිම ප්‍රතිශතයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළයුතු අතර 2024 වර්ෂය අවසාන වන විට එසේ ආයෝජනය කරන ලද හිමිකම් රක්ෂණ අරමුදලේ මුළු සමුච්චිත අරමුදල රුපියල් 261,861,225.83ක් වේ.


1.2 අරමුදල පිහිටුවා ඇති නෛතික රාමුව **(පනත,භාර ඔප්පුව,වෙනත්)**

- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 59 සහ 62 වගන්ති මඟින් රක්ෂණ අරමුදල සම්බන්ධව ප්‍රතිපාදන පනවා ඇත.

- අංක 1616/23 හා 2009.08.24 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින්, අරමුදලේ කාර්යයන්, අරමුදලේ ආයෝජන කිරීම්, කළමනාකරණ මණ්ඩලය, හානිපූර්ණය, අරමුදලේ මුල්‍ය පරිපාලනය හා විගණනය සම්බන්ධව නියෝග පනවා ඇත.


- එකී නියෝග පරිදි රක්ෂණ අරමුදල පවත්වාගෙන යනු ලබන අතර, රක්ෂණ අරමුදලේ ආදායම සහ අරමුදල රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කිරීම සම්බන්ධව තොරතුරු පහත දක්වා ඇත.

  - 2024 වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් 44,800,000.00 ක් වූ අතර රක්ෂණ අරමුදලට බැරවූ සත්‍ය ආදායම රුපියල් 44,169,276.00 ක් විය. ඒ අනුව 2024 වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලට බැර වූ ආදායම, 2023 වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලට බැර වූ ආදායමට වඩා රුපියල් 8,788,192 කින් වර්ධනය වී තිබුණි. 2024 වර්ෂයේ දී හිමිකම් ලියාපදිංචිය පුළුල්වීම ආදායම වර්ධනට හේතු වී ඇත.



- හිමිකම් රක්ෂණ අරමුදල සම්බන්ධයෙන් අංක 1616/23 හා 2009.08.24 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රතිපාදන අනුව කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් මත 2024 වර්ෂයේ රුපියල් 39,013,797.43 ක නව ආයෝජනයක් සිදු කරන ලදී.

- 2024 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුගත භාණ්ඩාගාර බිල්පත්/බැදුම්කර පොළී ආදායම රුපියල් 28,250,000.00 ක් වූ අතර සත්‍ය වශයෙන් ලද පොළී ආදායම රුපියල් 29,703,226.46 ක් විය.



- මෙම රක්ෂණ අරමුදල සඳහා අරමුදල් රැස් කරනු ලබන්නේ ලියාපදිංචි කර ඇති හිමිකම් සහතිකවලින් කරනු ලබන පසුගණුදෙනු ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු එකතු කිරීම තුළිනි. මේ දක්වා නිකුත් කර ඇති හිමිකම් සහතිකවලට අදාලව පසුගණුදෙනු සාධනපත්‍ර 70,577 ක් 2024 වර්ෂය තුළ ලියාපදිංචි කර ඇත.

- 2024 වර්ෂය ආරම්භයේදී හිමිකම් රක්ෂණ අරමුදලේ සමුච්චිත අරමුදල රුපියල් 193,211,589.98 ක් වන අතර 2024 වර්ෂය අවසාන වන විට මෙහෙයුම් අතිරික්තය එකතු කිරීමෙන් පසුව මුළු සමුච්චිත අරමුදල රුපියල් 261,861,225.83ක් වේ.

- හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුත් කළමනාකරණ මණ්ඩලය මෙම වර්ෂය තුල පස්වරක් රැස්විය. 2024 වර්ෂයේදි රක්ෂණ අරමුදලේ විගණන කමිටුව සිව්වරක් පවත්වන ලදී.

- එමෙන්ම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2022 වර්ෂයේ සිට කාර්ය සාධන වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් මුද්‍රණය කිරීම ආරම්භ කරන ලදි.

1.3 අරමුදලේ පරමාර්ථ

- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62 වගන්තිය යටතේ හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවා ඇත.

- මේ පනතේ 59 වැනි වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවක් අනුව රෙජිස්ටරයේ යම් නිවැරදි කිරීමක් හෝ,

- 59 වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවක් අනුව රෙජිස්ටරය නිවැරදි නොකිරීම,

- හේතු කොට ගෙන පාඩු හෝ අලාභ දැරීමට සිදුවූ හෝ අගතියට පත් යම් තැනැත්තකු, අධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මත රක්ෂණ අරමුදලින් ආණ්ඩුව විසින් හානිපූර්ණය කිරීම වේ.

1.4 අරමුදලේ දැක්ම, මෙහෙවර,අරමුණ

දැක්ම

හිමිකමේ අයිතිය ලියාපදිංචිය තුලින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජනතාවට සහය වීම.

මෙහෙවර

නිශ්චිත දේපලවලට අදාලව නීත්‍යානුකූල හිමිකමේ අයිතිය, රජයේ වගකීමක් සහිතව ලියාපදිංචි කිරීමේදී සිදු විය හැකි වංචනික ක්‍රියා හේතුවෙන්, අයිතිය සම්බන්ධයෙන් වන වැරදි තීරණයක් නිසා පාර්ශවකරුවන්ට සිදුවන හානිය සම්බන්ධයෙන් වන්දි ප්‍රධානය කිරීමයි.

අරමුණ

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත මඟින් ඉඩම් සම්බන්ධයෙන් ඔප්පු මඟින් සිදුවන ගණුදෙනු ලේඛනගත කිරීම වෙනුවට ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි. මෙම අයිතිය ලියාපදිංචි කිරීමේදී සිදු විය හැකි වංචනික ක්‍රියා හේතුවෙන්, අයිතිය සම්බන්ධයෙන් වන වැරදි තීරණයක් නිසා පාර්ශවකරුවන්ට සිදුවන හානිය සම්බන්ධයෙන් රජය වගකීමට බැඳෙන අතර, ඒ අනුව සිදුවන අලාභය වෙනුවට වන්දි ප්‍රදානය කිරීමට මෙම පනතේ විධිවිධාන සළසා ඇත. මෙම අරමුණ ඇතිව හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවන ලදී. මෙම හානිපූර්ණය කිරීමේදී පනතේ විධිවිධාන අනුව අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමුවිය යුතු අතර අධිකරණය මඟින් දෙනු ලබන තීන්දුවක් මඟින් අදාල පාර්ශවවලට ගෙවිය යුතු වන්දි මුදල තීරණය කරනු ලැබේ.

1.5 ප්‍රධාන කාර්යයන්

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62 වගන්තිය යටතේ පිහිටනු ලැබූ රක්ෂණ අරමුදලේ ප්‍රධාන කාර්යය වන්නේ, මෙම පනතේ 59 වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවක් අනුව රෙජිස්ටරයේ යම් නිවැරදි කිරීමක් හෝ 59 වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවකට අනුව රෙජිස්ටරය නිවැරදි නොකිරීම, හේතුකොටගෙන පාඩු හෝ අලාභ දැරීමට සිදුවූ හෝ අගතියට පත් යම් තැනැත්තෙකු, අධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මත හානිපූර්ණය කිරීම වේ.

➢ හානිපූර්ණය කිරීම

- අංක 1616/23 හා 2009.08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 22 වන වගන්තිය පරිදි යම් ඉඩමක හෝ යම් ඉඩමක සම්බන්ධතාවයක් පිළිබඳ වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචියක් සිදු වී ඇත්නම් එය සිදු වී අවුරුදු 3 ක් ඇතුලත අගතියට පත් වූ තැනැත්තා විසින් හානිපූර්ණයක් ලබා ගැනීම සඳහා අධිකරණයේ නඩුවක් දැමිය යුතුය.

- හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ අගතියට පත් පාර්ශවය සඳහා චංචාවක් සිදු කර පාඩු සිදු කල හෝ ඊට දායක වූ තැනැත්තා හෝ තැනැත්තන් සම විත්තිකරුවන් කරනු ලැබේ.

- ගැසට් පත්‍රයේ 25 වන වගන්තිය අනුව අගතියට පත් පාර්ශවය විසින් අධිකරණයට දැමූ නඩුව සඳහා හානිපූර්ණය ගෙවිය යුතු බවට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක අධිකරණ ආඥාවක් එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම් අධිකරණ ආඥාවේ දින සිට මාස 3ක් ඇතුලත එම හානිපූර්ණය සිදු කල යුතුය.

- එමෙන්ම හානිපූර්ණය කිරීම මාස 3කට වැඩි කාලයක් ප්‍රමාද කරනු ලබන අවස්ථාවක සම්පූර්ණ හානිපූර්ණ මුදල ගෙවා නිම වන තුරු එකී හානිපූර්ණ මුදල හෝ ඉතිරිව ඇති එහි ශේෂය මත නෛතික පොළිය ගෙවනු ලබයි.

- මේ වන තෙක් අරමුදලෙන් ගෙවිය යුතු වන්දි පිළිබඳව කිසිදු අධිකරණ තීන්දුවක් ලැබී නොමැති බැවින් හිමිකම් රක්ෂණ අරමුදල මඟින් කිසිදු හානිපූර්ණ වන්දියක් ගෙවා නොමැත.

➢ අරමුදල පිළිබඳ කළමනාකරණ මණ්ඩලයේ කාර්යභාරය

I. සමස්ථ වශයෙන් අරමුදලේ කළමනාකාරිත්වය සහ පරිපාලනය සඳහා වගකීම.

II. පනතේ විධිවිධාන ප්‍රකාරව හානි පූර්ණය සඳහා වූ හිමිකම්පෑමක් සාධාරණද නැද්ද, යන්න පිළිබඳව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට උපදෙස් දීම.

III. මණ්ඩලයේ කර්තව්‍ය සහ වගකීම් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා එහි කාර්ය පටිපාටිය පාලනය කරන නීති සහ මාර්ගෝපදේශ සෑදීම සහ අනුගමනය කිරීම.

IV. හානිපූර්ණය සඳහා වූ හිමිකම්පෑම් විමර්ශනය කිරීම සහ මේ පනත යටතේ හානිපූර්ණය ගෙවීමට අදාල වනුයේ යම් තැනැත්තකුගේ සාවද්‍යතාවය ද, එම තැනැත්තන් හඳුනාගැනීම සහ අරමුදලේ යථා තත්ත්වයට පත්කිරීම සඳහා එම තැනැත්තන්ගෙන් අයකරගත යුතු මුදල් ප්‍රමාණය තීරණය කිරීම.

V. (IV)ඡේදය යටතේ අරමුදලට සිදු වූ අලාභය අයකර ගැනීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔහුට උපදෙස් දීම.

VI. අරමුදලේ ගිණුම්වලට අදාල වාර්තා සහ අරමුදල ක්‍රියාත්මක වීම පිළිගත් ප්‍රමිතිවලට අනුකූලව පවත්වාගෙන යනු ලබන්නේද යන්න විමර්ශනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට උපදෙස් දීම.

VII. මණ්ඩලය විසින් කටයුතු කරනු ලබන සියලු කාරණාවලට අදාල වූ වාර්තාවල නිරවද්‍යතාවය, අංගසම්පූර්ණ බව සහ ආරක්ෂාව පිළිබඳ සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම.

VIII. හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සහ මහ බැංකුව විසින් පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන සියළු මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම.

IX. අරමුදල මුදල් ලැබීම සහ අරමුදලින් මුදල් පිටතට යෑම පිළිබඳව නීතිපතා සමාලෝචනය කිරීම සහ යම් අහිතකර අවස්ථාවන් නිවැරදි කිරීම සඳහා උචිත පියවර ගැනීම.

X. වාර්ෂික ඇස්තමේන්තුගත පරිපාලනමය වියදම් සමාලෝචනය කිරීමෙන් පසු සහ අවශ්‍ය නම් ප්‍රතිශෝධනය කිරීමෙන් පසු ඒවා අනුමත කිරීම.

1.6 සංවිධාන සටහන

2024 වර්ෂයේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්

- හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් (සභාපති) - ඩබ්.ආර්.ඒ.එන්.එස්.විජයසිංහ මයා

- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නියෝජිත,
  ප්‍රධාන ගණකාධිකාරී, ස්වදේශ කටයුතු අංශය - යූ.ජී.ආර්.දමයන්ති මිය

- ඉඩම් අමාත්‍යාංශයේ නියෝජිත,
  ප්‍රධාන ගණකාධිකාරී, කෘෂිකර්ම, පශු සම්පත්,
  ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය - ඊ.එල්.ඒ.පී.කුමාර මයා

- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිත,
  ප්‍රධාන අභ්‍යන්තර විගණක - හේමා සුරේෂ්කුමාර් මිය

- ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිත,
  අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ඩී.එල්. නිහාල් මයා

- ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව - ඒ.එස්.ඩබ්.කේ.නානායක්කාර මයා

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

හිමිකම් රක්ෂණ අරමුදල සඳහා විදේශ ආධාර ලබන ව්‍යාපෘති නොමැති බැවින් 1.7 කරුණ ආදාල නොවේ.

පරිච්ඡේදය 02- ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

- හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවා ඇත්තේ, 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ ප්‍රතිපාදන සහ අංක 1616/23 හා 2009.08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝග අනුවය.

- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62 වගන්තිය යටතේ පිහිටනු ලැබූ රක්ෂණ අරමුදලේ අරමුණ වන්නේ, මෙම පනතේ 59 වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවක් අනුව රෙජිස්ට්‍රරයේ යම් නිවැරදි කිරීමක් හෝ 59 වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවකට අනුව රෙජිස්ට්‍රරය නිවැරදි නොකිරීම , හේතුකොටගෙන පාඩු හෝ අලාභ දැරීමට සිදුවූ හෝ අගතියට පත් යම් තැනැත්තෙකු , අධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මත හානිපූර්ණය කිරීම වේ.

- නමුත් මේ වන තෙක්, අරමුදලෙන් ගෙවිය යුතු වන්දි පිළිබඳව කිසිදු අධිකරණ තීන්දුවක් ලැබී නොමැති බැවින් හිමිකම් රක්ෂණ අරමුදල මඟින් කිසිදු හානිපූර්ණ වන්දියක් ගෙවා නොමැත.

- ඉහත කරුණු අනුව මෙම අරමුදල වන්දි ප්‍රදානය කිරීම අරමුණු කොටගෙන පිහිටුවා ඇති අරමුදලක් වන බැවින් හදුනාගත් විශේෂ ජයග්‍රහණ , අභියෝග හා ඉදිරි ඉලක්ක විශේෂ කොට දැක්විය නොහැක.

.....

ඩබ්.ආර්.ඒ.එන්.එස්.විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල් / සභාපති
හිමිකම් රක්ෂණ අරමුදල


ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/2අ, ඩෙන්සිල් කොබේකඩුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල.

දිනය: 2024/06/20

පරිච්ඡේදය 03- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. 2024.12.31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

3.1.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය



හිමිකම් රක්ෂණ අරමුදල
2024.12.31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු.

2023.12.31		සටහන්	2024.12.31	
	වත්කම්			
184,419,763	ආයෝජන - 01) ජංගම නොවන			
	- භාණ්ඩාගාර බැඳුම්කර	උප.03	195,094,182	195,094,182
	02) ජංගම			
	- භාණ්ඩාගාර බැඳුම්කර	උප.03	54,185,865	54,185,865
184,419,763				249,280,047
	ජංගම වත්කම්			
5,837,337	ලැබිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර පොලී	උප.03	8,082,520	
-	ලැබිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර උපචිත පොලී	උප.03	1,150,441	
2,954,490	බැංකු ශේෂය		3,698,218	12,931,179
193,211,590	මුළු වත්කම්			262,211,226
	අඩු කළා : ජංගම වගකීම්			
-	විගණන ගාස්තු වෙන්කිරීමේ ගිණුම		350,000	(350,000)
193,211,590	ශුද්ධ වත්කම්			261,861,226
138,326,030	සමුච්චිත අරමුදල			193,211,590
54,885,560	එකතු කළා : මෙහෙයුම් අතිරික්තය			68,649,636
193,211,590	අරමුදල			261,861,226

ඉහත ගිණුම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙළ කර ඇති බවත් එම ගිණුම්වල නිවැරදි භාවය පිළිබඳ වගකීම් දරන බවත් සහතික කරමි.

ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්/ භාරකාර
හිමිකම් රක්ෂණ අරමුදල

ආර්.ටී.කේ වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ඒ.එල්.ඒ.පී.කුමාර
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් අමාත්‍යාංශය
බත්තරමුල්ල


දිනය: 2025. 03 .24

ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/1/1, නෙත්සිල් කොම්ප්ලෙක්සය මාවත
කොස්වත්ත, බත්තරමුල්ල.

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
කොස්වත්ත, බත්තරමුල්ල.

ඒ.එල්.ඒ.පී. කුමාර
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර" ඉඩම් මහලේකම් කාර්යාලය
1201/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

3.1.2 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය



භිමිකම් රක්ෂණ අරමුදල
2024.12.31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

රු.

2023.12.31 ට තත්‍ය ආදායම් / වියදම්		සටහන්	2024.12.31 ට තත්‍ය ආදායම් / වියදම්	
	අයභාරය			
35,381,084	භිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම්	උප.01		44,169,276
-	සමුච්චිත අරමුදලට පෙර වර්ෂයේ ගැලපීම්	උප.03		(67,388)
	භාණ්ඩාගාර ආයෝජන පොළි ආදායම්			
205,976	රිපෝ බිල්පත් පොලී ආදායම්	උප.02	569,722	
20,114,639	භාණ්ඩාගාර බැඳුම්කර පොලී ආදායම්	උප.03	27,856,160	
-	භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම්	උප.04	1,293,094	
248,919	භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය	උප.03	(15,750)	29,703,226
55,950,618	**මුළු අයභාරය**			73,805,114
	වියදම්			
132,000	කළමනාකරණ කමිටු දීමනා		174,000	
24,000	විගණන කළමනාකරණ කමිටු දීමනා		96,000	
553,113	කාර්ය මණ්ඩල දීමනා		528,825	
37,819	සංග්‍රහ වියදම්		35,230	
283,890	විගණන ගාස්තු (2023 & 2024 වර්ෂ)		693,380	
-	ප්‍රාරම්භක වෙන්දේසි ලංසු ගාස්තු		40,000	
-	ප්‍රචාරණ වියදම්		175,300	
-	ආදායම් බදු වියදම්		3,363,777	
34,235	ලිපිදුවම් වියදම්		48,968	
(1,065,057)	**මුළු වියදම්**			(5,155,480)
54,885,560	**කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය**			68,649,636

ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්/ සභාපති
භිමිකම් රක්ෂණ අරමුදල


ආර්.ටී.කේ වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දිනය 2025.

ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්
අංක. 234/එ3, ඩෙන්සිල් කොබේකඩුව මාවත
බත්තරමුල්ල.

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.

3.1.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය



හිමිකම් රක්ෂණ අරමුදල

2024.12.31 න් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.

2023.12.31			සටහන්	31.12.2024		
		මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්				
		ලැබීම්				
	35,381,084	හිමිකම් ලියාපදිංචි ගිවීමේ ආදායම	උප.01			44,169,276
		ආයෝජන වලින් ලද පොලිය				
205,976		ටිපෝ බිල්පත් පොලී ආදායම			-	
19,873,103		භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයෙන් ලද පොළිය	උප.03		27,763,915	
(2,221,215)	17,857,864	උපචිත බැඳුම්කර පොළිය			-	27,763,915
	53,238,948					71,933,191
		ගෙවීම්				
553,113		කාර්ය මණ්ඩල දීමනා			528,825	
37,819		සංග්‍රහ වියදම්			35,230	
132,000		කළමනාකරණ කමිටු දීමනා			174,000	
24,000		විගණන කළමනාකරණ කමිටු දීමනා			96,000	
580,290		විගණන ගාස්තු			343,380	
-		ප්‍රචාරණ වියදම්			175,300	
-		ප්‍රාථමික වෙන්දේසි ලංසු ගාස්තු			40,000	
-		ආදායම් බදු වියදම්			3,363,777	
34,235	(1,361,457)	ලිපිදුවාය වියදම්			48,968	(4,805,479)
	51,877,490	මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය				67,127,712
		ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්				
		කල් පිරුණු ටිපෝ බිල්පත් (පොළිය සමඟ)	උප.02	151,823,326		
		කල් පිරුණු භාණ්ඩාගාර බිල්පත් (පොළිය සමඟ)	උප.04	59,313,744		
134,450,254		කල් පිරුණු භාණ්ඩාගාර බැඳුම්කර	උප.03	105,856,000	316,993,070	
		භාණ්ඩාගාර බැඳුම්කර	උප.03	174,102,801		
		භාණ්ඩාගාර බිල්පත්	උප.04	58,020,650		
		ටිපෝ බිල්පත්	උප.02	151,253,603		
184,419,763		ආයෝජන වල වර්ධනාකම			383,377,054	
	(49,969,508)	ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්				(66,383,985)
	1,907,982	මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම /අඩුවීම				743,728
	1,046,508	කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ				2,954,490
	2,954,490	කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ				**3,698,218**

ආර්.ටී.කේ වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
කොස්වත්ත, බත්තරමුල්ල.

3.1.4 ලැබීම් හා ගෙවීම් ගිණුම

හිමිකම් රක්ෂණ අරමුදල
2024.12.31 න් අවසන් වර්ෂය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

රු.

2023.12.31		සටහන්	31.12.2024	
1,046,508	2024.01.01 දිනට ශේෂය			2,954,490
	ලැබීම්			
134,450,254	ආයෝජන කල් පිරීම්- භාණ්ඩාගාර බැඳුම්කර	උප.03	105,856,000	
-	ආයෝජන කල් පිරීම්- භාණ්ඩාගාර බිල්පත් (පොළිය සමඟ	උප.04	59,313,744	
-	ආයෝජන කල් පිරීම්- රිපෝ බිල්පත්	උප.02	151,253,603	
35,381,084	හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම	උප.01	44,169,276	
205,976	රිපෝ බිල්පත් ආයෝජනයෙන් ලද පොළිය	උප.02	569,722	
19,624,184	භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයෙන් ලද පොළිය	උප.03	27,763,915	
248,919	භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය		-	
(2,221,215)	භාණ්ඩාගාර බැඳුම්කර උපචිත පොළිය		-	388,926,261
188,735,711	**මුළු ලැබීම්**			391,880,751
	ගෙවීම්			
184,419,763	භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන	උප.03	171,358,886	
-	භාණ්ඩාගාර බැඳුම්කර උපචිත පොළිය	උප.03	2,743,915	
-	රිපෝ බිල්පත් වල ආයෝජනය	උප.02	151,253,603	
-	භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය	උප.04	58,020,650	
132,000	කළමනාකරණ මණ්ඩල කමිටු දීමනා		174,000	
24,000	විගණන කළමනාකරණ කමිටු දීමනා		96,000	
553,113	කාර්ය මණ්ඩල දීමනා		528,825	
37,819	සංග්‍රහ වියදම්		35,230	
580,290	විගණන ගාස්තු		343,380	
-	ප්‍රාථමික වෙන්දේසි ලංසු ගාස්තු		40,000	
-	ප්‍රචාරණ වියදම්		175,300	
-	ආදායම් බදු වියදම්		3,363,777	
34,235	ලිපිද්‍රව්‍ය වියදම්		48,968	
185,781,220	**මුළු ගෙවීම්**			(388,182,533)
2,954,490	**2024.12.31 දිනට අවසන් ශේෂය**			**3,698,218**

ආර්.ටී.කේ වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
ශ්‍රාස්ථවත්ත, බත්තරමුල්ල.

07

3.1.5 ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

හිමිකම් රක්ෂණ අරමුදල

2024.12.31 ත් අවසන් වර්ෂය සඳහා

ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

රු.

	පාලන අක්ෂිකර්වයේ අයිතිකරුවන්ට අදාළ වන					සුළු කොටස් හිමි අයිතිය	මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය
	සහභාගී වූ ප්‍රාග්ධනය	වෙනත් සංචිත	පරිවර්තන සංචිතය	සමුච්චිත ලාභ/(අලාභ)	මුළු එකතුව		
2024.01.01 දිනට ශේෂය	-	-	-	193,211,590	193,211,590	-	193,211,590
ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම	-	-	-				
නැවත ප්‍රකාශිත ශේෂය	-	-	-	-	-	-	-
2024 සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධයෙහි වෙනස්වීම	-	-	-	-	-	-	-
ඳේහ ප්‍රතාගණනය මත අතිරික්තය	-	-	-	-	-	-	-
අගයවුන ප්‍රතාගණනය මත අලාභ	-	-	-	-	-	-	-
විදේශ මෙහෙයුම් විනිමය පරිවර්තන අලාභය	-	-	-	-	-	-	-
ශුද්ධ වත්කම්/ ස්කන්ධයෙහි හඳුනාගන්නා ලද ශුද්ධ අගණයෙහි වර්ධනය	-	-	-	-	-	-	-
කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය	-	-	-	68,649,636	68,649,636	-	68,649,636
කාලපරිච්ඡේදය සඳහා හඳුනාගත් මුළු අලාභ සහ විසඳුම්	-	-	-	-	-	-	-
2024.12.31 දිනට ඉතිරියට ගෙන ගිය ශේෂය	-	-	-	261,861,226	261,861,226	-	261,861,226

3.1.6 ශේෂ පිරික්සුම

භිමිකම් රක්ෂණ අරමුදල

2024.12.31 දිනට

ශේෂ පිරික්සුම


රු

විස්තරය	හර	බැර
සමුච්චිත අරමුදල		193,211,590
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන ගිණුම	249,280,047	
ප්‍රාථමික වෙන්දේසි ලංසු ගාස්තු ගිණුම	40,000.00	
භාණ්ඩාගාර බැඳුම්කර වල පොළී ආදායම් ගිණුම		27,856,160
භාණ්ඩාගාර බිල්පත් වල පොළී ආදායම් ගිණුම		1,293,094
රිපෝ බිල්පත් වල පොළී ආදායම් ගිණුම		569,722
භාණ්ඩාගාර බැඳුම්කර අධිභාර ගිණුම්	15,750	
ලැබිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර උපචිත පොළී	1,150,441	
භිමිකම් ලියාපදිංචිකිරීමේ ආදායම් ගිණුම		44,169,276
ලැබිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර පොළී ගිණුම් (උපලේඛන අංක 3)	8,082,520	
සමුච්චිත අරමුදලට පෙර වර්ෂයේ ගැලපීම්	67,388	
කාර්ය මණ්ඩල දීමනා ගිණුම	528,825	
සංග්‍රහ වියදම් දීමනා ගිණුම	35,230	
කළමනාකරණ මණ්ඩල රැස්වීම් දීමනා ගිණුම	174,000	
ලිපිද්‍රව්‍ය වියදම් ගිණුම	48,968	
ප්‍රචාරණ වියදම් ගිණුම	175,300	
විගණන කළමනාකරණ කමිටු දීමනා	96,000	
ගණන ගාස්තු ගිණුම (2023 & 2024 වර්ෂ)	693,380	
විගණන ගාස්තු වෙන්කිරීමේ ගිණුම		350,000
ආදායම් බදු වියදම් ගිණුම	3,363,777	
බැංකු ශේෂය	3,698,218	
	267,449,843	**267,449,843**

ආර්.ටී.කේ වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
කොස්ගහත්ත, බත්තරමුල්ල.

3.1.7 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්



සටහන්

මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්

01. ආයතනික තොරතුරු

හිමිකම් ලියාපදිංචිය සඳහා ආරක්ෂිත ජාලයක් සැපයීමත් සහ හානියකට හෝ අලාභයකට මුහුණ දෙන පුද්ගලයන් හට අධිකරණ නියෝග මත වන්දි ගෙවීමත් පරමාර්ථ කොටගෙන 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වන වගන්තියට 2009 අගෝස්තු 21 දින ගෙන එන ලද සංශෝධනයට අනුකූලව මෙම අරමුදල ක්‍රියාත්මක වේ. හිමිකම් රක්ෂණ අරමුදලේ කාර්යාලය අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයේ පිහිටා ඇත.

02. සැකසීමේ මූලධර්ම

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සහ එහි සංශෝධන වලට අනුකූලව ගිණුම් ප්‍රකාශ පිළියෙල කර ඇත.

2.1 අනුකූලතා ප්‍රකාශය

හිමිකම් රක්ෂණ අරමුදලේ මූල්‍ය ප්‍රකාශ රජයේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) වලට අනුකූලව පිළියෙල කර ඇත.

2.2 අඛණ්ඩතාව

හිමිකම් රක්ෂණ අරමුදල දිගටම පවත්වාගෙන යාමේ හැකියාව සහ එය විසුරුවා හැරීමට හෝ නවතා දැමීමට අදහස් නොකරන බවට එහි අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් තහවුරු කර ඇත.

03. ආදායම

2024 වර්ෂයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් ලද ආදායමෙන් 40% ක් අරමුදලට ප්‍රේෂණය කර ඇති අතර එම මුදල රු. **44,169,276.00** කි. *(උපලේඛන අංක -01)*

04. කාර්ය මණ්ඩල දීමනා

පරිපාලන කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකු සඳහා කාර්ය මණ්ඩල දීමනා ගෙවා ඇත.

11

05. කළමනාකරණ කමිටු දීමනා

කළමනාකරණ මණ්ඩල සහ විගණන කලමනාකරණ කමිටු දීමනා සඳහා රුපියල් 174,000.00 ක් ගෙවීම් කර ඇත.

06. විගණන ගාස්තු

2023 වර්ෂය සඳහා 2024 වර්ෂයේදී විගණන ගාස්තු ලෙස රුපියල් 343,380.00 ක මුදලක් ගෙවා ඇත.

07. ආයෝජන

2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැදුම්කර වල වටිනාකම රුපියල් 249,280,047.15 කි. (උපලේඛන අංක 03)

08. ආයෝජන මත පොළි

ලැබිය යුතු ආයෝජන පොළි		
2024.12.31 දිනට භාණ්ඩාගාර බැදුම්කර (උපලේඛන 03)		8,082,520.13
භාණ්ඩාගාර බිල්පත්/බැදුම්කර පොළි ආදායම		
2024.12.31 දිනට භාණ්ඩාගාර බැදුම්කර වලින් ලැබිය යුතු පොළිය	(උපලේඛන 03)	8,082,520.13
2024.12.31 දිනට භාණ්ඩාගාර බැදුම්කර ලද පොළිය	(උපලේඛන 03)	19,773,639.89
2024.12.31 දිනට රිපෝ බිල්පත් වලින් ලැබුණු පොළිය	(උපලේඛන 02)	569,722.34
2024.12.31 දිනට භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබුණු පොළිය	(උපලේඛන 04)	1,293,094.35
		29,718,976.71
ලැබුණු ආයෝජන පොළි		
2024.12.31 දිනට රිපෝ බිල්පත් වලින් ලැබුණු පොළිය	(උපලේඛන 02)	569,722.34
2024.12.31 දිනට භාණ්ඩාගාර බැදුම්කර වලින් ලැබුණු පොළිය	(උපලේඛන 03)	19,773,639.89
2024.12.31 දිනට භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබුණු පොළිය	(උපලේඛන 04)	1,293,094.35
		21,636,456.58

12

09. **ආදායම් බදු**

ආදායම් බදු සඳහා රුපියල් 3,363,776.71 ක මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කර ඇත

10. **ලංසු ගාස්තු**

ප්‍රාථමික වෙන්දේසි ක්‍රමය යටතේ විලදී ගත් රජයේ සුරැකුම්පත් වෙනුවෙන් ලංසු ගාස්තු රුපියල් 40,000.00ක් ගෙවීම් කර ඇත.

11. **ප්‍රචාරණ සහ දැන්වීම් ගාස්තු**

ප්‍රචාරණ සහ දැන්වීම් ගාස්තු සඳහා රුපියල් 175,300.00ක මුදලක් ගෙවීම් කර ඇත.

12. **ලිපිද්‍රව්‍ය වියදම**

ලිපිද්‍රව්‍ය වෙනුවෙන් රුපියල් 48,967.50ක් ගෙවීම් කර ඇත.

13

3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන(පවතීනම්) උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

හිමිකම් රක්ෂණ අරමුදල සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන නොමැති බැවින් 3.2 කරුණ ආදාල නොවේ.


3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

හිමිකම් රක්ෂණ අරමුදල සඳහා පරිත්‍යාග සහ වෙනත් ලැබීම් නොමැති බැවින් 3.3 කරුණ ආදාල නොවේ.

3.4. මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

හිමිකම් රක්ෂණ අරමුදල සඳහා මුල්‍ය නොවන වත්කම් නොමැති බැවින්3.4 කරුණ ආදාල නොවේ.

3.5 විගණකාධිපතිගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/G/RGD-TIF/FA/2024/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 27 දින

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
28 MAY 2025
රෙජිස්ට්‍රාර් ජනරාල් අංශය

රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

හිමිකම් රක්ෂණ අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

18 JUN 2025

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
28 MAY 2025
මූල්‍ය අංශය


ඒ.එච්.ඒ. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

පිටපත: 1. ලේකම් - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
28 MAY 2025
මූල්‍ය අංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/G/RGD-TIF/FA/2024/01
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2025 මැයි 27 දින

රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

හිමිකම් රක්ෂණ අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හිමිකම් රක්ෂණ අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තරකර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1.21 ප්‍රකාරව අයවැයගත සංඛ්‍යා සහ තථ්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් දැක්වෙන අතිරේක මූල්‍ය ප්‍රකාශනයක් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස දැක්විය යුතු වුව ද, එසේ සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2.56 ප්‍රකාරව අස්ථිත්වයක් විසින් මුදල් හා මුදල් සමාන දෑවල සංරචක හෙළිදරව් කර නොතිබුණු අතර, අරමුදල වෙනුවෙන් ඉදිරිපත්කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇති එම අයිතමයන්ගේ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාකර ඇති අයිතමයන් සමඟ සැසඳීමක් සිදුකළ යුතු වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම සැසඳීම සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 03හි 51 ඡේදය ප්‍රකාරව පෙර කාලපරිච්ඡේදයක වැරැද්දක්, වරද සොයා ගනු ලැබූ කාලපරිච්ඡේදයේ අනිරික්තයෙන් හෝ ඌණතාවයෙන් නිවැරදි කළ නොහැකි අතර, 2023 වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා වෙන්කිරීමක් සිදුනොකර සමාලෝචිත වර්ෂය තුළ රු.343,380ක් ගෙවීම හේතුවෙන් 2024 වර්ෂයේ අනිරික්තය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2018 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් හිමිකම් රක්ෂණ අරමුදල විසින් ගෙවිය යුතු මුළු ආදායම් බදු බැරකම් රු.24,179,923ක් වූ අතර ඉන් 2018 සිට 2023 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.15,268,955ක් වූ ආදායම් බදු වෙනුවෙන් කිසිදු වෙන්කිරීමක් සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් බදු බැරකම රු.8,910,968ක් වූ අතර ඉන් වර්ෂය තුළදී රු.3,363,777ක් ගෙවා තිබුණු නමුත් රු.5,547,191ක් වූ හිඟ ආදායම් බදු බැරකම වෙනුවෙන් වෙන්කිරීමක් සිදු කර නොතිබුණි. ඒ අනුව ආදායම් බදු වෙනුවෙන් වෙන්කිරීමක් සිදුනොකිරීම මත ප්‍රමාණාත්මක වරදක් පැනනැඟී තිබුණ ද, එය නිවැරදි කිරීමට අවශ්‍ය ගැළපීම් කටයුතු නොකිරීම හේතුවෙන්, 2024 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ආදායම් බදු වගකීම වූ රු.20,816,146කින් සමුච්චිත අරමුදලේ ශේෂය වැඩියෙන්ද, එදිනට ජංගම බැරකම් ශේෂය එම වටිනාකමෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

2

(ඉ) මුදල් පොත අනුව හිමිකම් ආදායම රු.110,423,190ක් හා හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එවනු ලබන දෙසති වාර්තා අනුව හිමිකම් ආදායම රු.110,039,825ක් විය. ඒ අනුව හඳුනානොගත් හිමිකම් ආදායම රු.580,820ක් විය. තවද නියමිත කාලය තුළ බැංකුගත නොකරන ලද හිමිකම් ආදායම් රු.283,065ක් විය.

(ඊ) 2023 වර්ෂයේ භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම රු.67,388කින් වැඩියෙන් ගණනය කිරීම නිවැරදි කිරීම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළ සමුච්චිත අරමුදලට ගැළපීම් නොකර 2024 වර්ෂයේ හිමිකම් ආදායමෙන් අඩුකර 2024 ජනවාරි 01 දිනට පැවති රු.193,211,590ක් වූ සමුච්චිත අරමුදල් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබීම නිසා, 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය රු.67,388කින් වැඩියෙන් ද, සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමෙන් අඩුවෙන් ද දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරබවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව-පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග අංක 42 (ඉ)	හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් හිමිකම් ආදායම් සම්බන්ධ සති 02කට වරක් ප්‍රධාන කාර්යාලය වෙත ලබාදෙන වාර්තා පදනම්කර ගෙන අරමුදලේ හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම ගණනය කළ යුතු වුව ද, හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් දෛනිකව බැංකුගත කරන මුදල් වටිනාකම් මත පදනම්ව ආදායම ගණනයකර තිබුණි. ඒ හේතුවෙන් අරමුදලේ මුළු ලැබීම්වල වටිනාකමේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 177(1)	ලැබෙන සියලුම මුදල් දිනපතා හෝ හැකිතාක් කලින් බැංකුගත කළ යුතු වුවත්, ඊට පටහැනිව මුදල් බැංකුගත කිරීම දින 01 සිට 06ක් දක්වා කාලයක් අතරඳවාගන්නා අවස්ථා පැවතුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 42(ආ) හා (ඇ) ප්‍රකාරව ඇතැම් හිමිකම් කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය වෙත එවන ලද හිමිකම් ආදායම පිළිබඳ වාර්තා "ආර්.ජී.ටී/අයි.එෆ් 03" ආකෘතියට අනුකූල නොවූ අතර, ඒ හේතුවෙන් අදාල කාර්යාල විසින් වාර්තා ඉදිරිපත් කිරීමේදී ඒකාකාරී ස්වරූපයක් අනුගමනය නොකිරීම නිසා ඒවා සැසඳීමට නොහැකි වී තිබුණි.

(ආ) යථෝක්ත නියෝග අංක 42(ආ) ප්‍රකාරව ප්‍රධාන කාර්යාලයට හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලැබෙන වාර්තා ඇතුළත් කිරීමට ආකෘති අංක "ආර්.ජී.ටී/අයි.එෆ් 02" අනුව රෙජිස්ටරයක් නඩත්තු කළ යුතු වුව ද, එම රෙජිස්ටරය ද අදාළ ආකෘතිය ප්‍රකාරව සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාල විසින් එකතු කරන ලද ආදායම් අප්‍රමාදව බැංකුගත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තු මාසික ආදායම් වාර්තා හා හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාල විසින් ඉදිරිපත් කරන දෙසති වාර්තා එකිනෙකට අසමාන වීමේ ඉඩකඩ පැවතුණි.

3.3 කාර්යසාධනය

1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීමේදී අයිතිය සම්බන්ධයෙන් වැරදි තීරණයක් ගැනීම හේතුවෙන් පාර්ශවකරුවන්ට සිදුවන අලාභ සඳහා රජය විසින් වන්දි ප්‍රදානය කිරීම අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වුව ද, අරමුදල ආරම්භ වූ 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු හානිපූරණ වන්දි ඉල්ලීමක් ඉදිරිපත් වී නොතිබුණි.

ජී.ඒ්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 අරමුදලේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
කළමනාකරණ මණ්ඩල රැස්වීම පැවැත්වීම	✓		
වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම	✓		
හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් ආදායම් රැස්කිරීම	✓		
හානිපූර්ණය කිරීම	හිමිකමේ අයිතිය ලියාපදිංචිය තුලින් වැරදි සහගත හිමිකම් ලියාපදිංචියක් සම්බන්ධයෙන් අගතියටපත් පාර්ශවයක් වෙත හානිපූර්ණය කිරීම සඳහා අධිකරණ නියෝගයක් මෙතෙක් ලැබී නොමැත.		
ආයෝජන සිදු කිරීම	✓		

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු

5.1 හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
1 **සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.** 1.4.විශේෂයෙන්ම දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ **දේපළ උරුමයන්**, ස්වාභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මුල්‍ය ඇතුළුව මුල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම. ❖ හිමිකම් රක්ෂණ අරමුදල මඟින් මෙම අරමුණ සඳහා සෘජුවම දායකත්වයක් ලබානොදෙන අතර වක්‍ර දායකත්වයක් ලබාදෙනු ලබයි.	අගතියටපත් පාර්ශව, අධිකරණ ආඥාවක් මත රක්ෂණ අරමුදලින් හානිපූර්ණය කිරීම	අධිකරණ ආඥාව මත අගතියටපත් පාර්ශව හානිපූර්ණය කිරීම			2010 වර්ෂයේ රක්ෂණ අරමුදල ආරම්භයේ සිට මේ දක්වා හානිපූර්ණය කිරීම සම්බන්ධව අධිකරණ නියෝගයක් ලැබී නොමැත.

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

බිම් සවිය වැඩසටහන යටතේ හිමිකම් ලියාපදංචිය සිදුවන්නේ මිනින්දොරු දෙපාර්තමේන්තුව, හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු ත්‍රිත්වයේ සාමූහික ක්‍රියාවලියක් තුලිනි. බිම් සවිය යටතේ ඉඩම් සඳහා කැඩැස්තර සිතියම් සකස් කිරීම හා එකී ඉඩම් කැබැලිවල හිමිකම් නිරවුල් කිරීම මත හිමිකම් ලියාපදිංචිය පදනම් වෙයි. හිමිකම් යටතේ ලියාපදිංචි සෑම ඉඩමක් සම්බන්ධයෙන්ම, අගතියට පත් වූ සෑම අයෙකුටම හිමිකම් රක්ෂණ අරමුදලින් වන්දි ලබාගැනීම සඳහා අධිකරණයෙන් ඉල්ලුම් කිරීමේ හැකියාව ඇත. මැනුම් කටයුතු සහ නිරවුල් කිරීමේ කටයුතු වේගවත් කර ශ්‍රී ලංකාවේ සියළුම ඉඩම් හිමිකම් යටතේ ලියාපදිංචි කිරීම තුළින් එය වක්‍රාකාරයෙන් මෙම අරමුදලේ ඉලක්ක අරමුණු සපුරා ගැනීමට හේතු වේ. මෙමගින් පුද්ගලයින් ආර්ථික හා මානසික වශයෙන් සවිබල ගැන්වීමක් ද සිදුවේ.

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

හිමිකම් රක්ෂණ අරමුදල සඳහා අනුමත වූ සේවක සංඛ්‍යාවක් නොමැති අතර හිමිකම් රක්ෂණ අරමුදලේ කටයුතු සිදු කිරීම සඳහා පත්ව ඇති නිළධාරීන් විසින් තම රාජකාරි වලට පරිභාහිරව මෙම කටයුතු සිදු කරයි.

6.2 අරමුදලේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

6.3 මානව සම්පත් සංවර්ධනය

හිමිකම් රක්ෂණ අරමුදලේ මානව සම්පත් සංවර්ධනය සඳහා රජයේ සුරුකුම්පත්වල මුදල් ආයෝජනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024.06.14 දින පුහුණුවක් ලබාදෙන ලදී.

පරිච්ඡේදය 07 -අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.	අනුකූල වේ		
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.6	වෙනත්	අනුකූල වේ		
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.145)	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	ආදාල නොවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	ආදාල නොවේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	ආදාල නොවේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	ආදාල නොවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	ආදාල නොවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	ආදාල නොවේ		
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය(GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	ආදාල නොවේ		
03	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මූ.රෙ 135)	අනුකූල වේ		
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන	අනුකූල වේ		

	පරිදි බලතල පවරාදී තිබීම			
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රජයාගිණුම්චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	ආදාල නොවේ		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම	අනුකූල වේ		
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	ආදාල නොවේ		
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනය ඉදිරිපත් කිරිමට	අනුකූල වේ		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරිම	කාර්තු වාර්තා කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.		
5	විගණන විමසුම්	අනුකූල වේ		
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	ආදාල නොවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ40(4)උප වගන්තිය ප්‍රකාරව,සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණනන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරිම	ආදාල නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	ආදාල නොවේ		
7	විගණන හා කළමනාකරණ කමිටු	අනුකූල වේ		
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම.	අනුකූල වේ		

8	වත්කම් කළමනාකරණය	ආදාල නොවේ		
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණය චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	ආදාල නොවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදයේ ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	ආදාල නොවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	ආදාල නොවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	ආදාල නොවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	ආදාල නොවේ		
9	වාහන කළමනාකරණය	ආදාල නොවේ		
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	ආදාල නොවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	ආදාල නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	ආදාල නොවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	ආදාල නොවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	ආදාල නොවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	ආදාල නොවේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ	අනුකූල වේ		

	පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම			
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	ආදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය	ආදාල නොවේ		
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	ආදාල නොවේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	ආදාල නොවේ		
12	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	ආදාල නොවේ		
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	ආදාල නොවේ		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	ආදාල නොවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	ආදාල නොවේ		
13	පොදු තැන්පත් ගිණුම	ආදාල නොවේ		
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	ආදාල නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	ආදාල නොවේ		
14	අග්‍රිම ගිණුම	ආදාල නොවේ		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේශණය කර තිබීම	ආදාල නොවේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	ආදාල නොවේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	ආදාල නොවේ		
14.4	අග්‍රිම ගිණුමෙහි ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	ආදාල නොවේ		
15	ආදායම ගිණුම්	ආදාල නොවේ		
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	ආදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		

15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	ආදාල නොවේ
16	මානව සම්පත් කළමනාකරණය	ආදාල නොවේ
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	ආදාල නොවේ
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තුව ලිඛිතව ලබාදී තිබීම	ආදාල නොවේ
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	ආදාල නොවේ
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම	ආදාල නොවේ
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	ආදාල නොවේ
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	ආදාල නොවේ
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	ආදාල නොවේ
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම	ආදාල නොවේ
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරන අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලිහී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	ආදාල නොවේ
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	ආදාල නොවේ
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම	ආදාල නොවේ
19.1	2018.01.24 දිනැති රජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 අකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	ආදාල නොවේ
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත	ආදාල නොවේ

	සඳහන් මානව සම්පත් සැලැස්ම සකස් කොට තිබීම			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන අකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම අත්සන් කර තිබීම	ආදාල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම. ධරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම. නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත් කොට තිබීම	ආදාල නොවේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම	ආදාල නොවේ		
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		